1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්), වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3 වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීම දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකල යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : සහකාර සාමාන්‍යාධිකාරී (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03, දුරකථන අංක : 011-2456285, 2456283, 2456284

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක 011-3068185, 011-2572940.

02-122

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 1900003049.

ණයකරුගේ සම්පූර්ණ නම : ඉදුරගේ සාන්ත විජිත් කුමාර.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2009.08.21 වැනි දින අංක 1616 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2009.08.21 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ තිනකුරල්" පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 22, ප්‍රනාන්දු මාවත, ඩයස් ගැරේජ් ගොඩනැගිල්ල, මීගමුව යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඩබ්ලිව්. පී. සී. පෙරේරා විසින් 2010.02.24 වැනි දින පෙ.ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ අටදහස් හාරසිය අනූදෙකයි ශත තිස්එකක් (රු.3,08,492.31) මුදලක් වර්ෂ 2009.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ පනස්දහසක (රු.250,000) මුදල ද, 2009.01.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් පනස්අටදහස් හාරසීය අනූදෙකයි ශත තිස්එකක් (රු.58,492.31) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තුන්ලක්ෂ අටදහස් හාරසීය අනූදෙකයි ශත තිස්එකක් (රු.308,492.31) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ පනස්දහසක (රු.250,000) මුදල මත අයවිය යුතු වර්ෂයකට 18.90% බැගින් වන පොළියක් 2009.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට,

**උපලේඛනය**

වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ, හලාවත ලියාපදිංචි කොට්ඨාසයේ උතුරු පිටිගල් කෝරළේ යාගම් පත්තුවේ හලාවත ප්‍රාදේශීය සභා සීමාවේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලේකැලේ ග්‍රාමයේ හි පිහිටි පල්ලේකැලේ නමැති ඉඩමට 2005.05.22 දින ඩබ්. එස්. ඩී. කරුණාසේන මානක තැන විසින් මැන සම්පාදිත අංක 728 පිඹුර ප්‍රකාර ලොට් 1 ට මායිම් උතුරට ගල්ගමුවේ සිට තිඹිරිගස්වෙලට යන ප්‍රාදේශීය සභා පාර, නැගෙනහිරට : ඩබ්. එම්. ප්‍රේමතිස්ස හිමිකිම් කියන ඉඩම (ලොට් 133 P.P.A.1474) ද, දකුණට : එම්. ජස්ටින් ප්‍රනාන්දු හිමිකම් කියන ඉඩම (ලොට් 147 P. P. A. 1474) ද, බටහිරට : ඩබ්. අමරසේකර හිමිකම් කියන ඉඩම (ලොට් 131 P. P. A. 1474) ද යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් එකක (අක්. 0, රූ. 2, පර්. 1) වපසරයකින් යුතු මෙම ඉඩම ගොඩනැගිලි සහ ඊට අයත් සියළුදේ ද, මාර්ග පරවශතාවය ද සමග හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ මාද 19/96 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2010 ක් වූ ජනවාරි මස 21 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

02-180

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2005500022.

ණයකරුගේ සම්පූර්ණ නම : දිපාලි දම්මලිකා දිසානායක සහ රත්නායක මුදියන්සේලාගේ නිහාල් රත්නායක.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2008.09.26 වැනි දින අංක 1567 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2008.09.26 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්"පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදල් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 28, නව කාර්යාල සංකීර්ණය, කුමාරතුංග මාවත, කුරුණෑගල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. අයි. ගල්ලෑල්ල මයා විසින් 2010.02.25 වැනි දින ප.ව. 2.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ පනස්නමදහස් හාරසීයයි ශත අසූහතරක (රු.259,400.84) මුදලක් වර්ෂ 2006.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ හතළිස්දහස් එකසිය හැටහතයි ශත දහඅටක (රු.240,167.18) මුදලද, 2006.09.30 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් දහනමදහස් දෙසීය තිස්තුනයි ශත හැටහයක් (රු.19,233.66) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ පනස්නමදහස් හාරසීයයි ශත අසූහතරක් (රු.259,400.84) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ හතළිස්දහස් එකසිය හැටහතයි ශත දහඅටක (රු.240,167.18) මුදල මත අයවිය යුතු වර්ෂයකට 9.50% බැගින් වන පොළියක් 2006.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

**උපලේඛනය**

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, උතුරු කලාගම් කෝරළේ කලාගම් පළාතේ අනුරාධපුර ලියාපදිංචි කොට්ඨාසයේ ඉපලෝගම ප්‍රාදේශීය සභා සීමාව තුළ කඩම්ගස්සේගම ග්‍රාමයේ පිහිටි ගංගොඩ නමැති ඉඩමට 2002.09.13 දින කේ. කේ. සින්නයියා මානක තැන විසින් මැන සම්පාදිත අංක 165 පිඹුර ප්‍රකාර ලොට් 3 ට මායිම් උතුරට : ලොට් 2 ද, නැගෙනහිරට : එන්. රත්නායකගේ සහ ඊ. එම්. බිසෝමැණිකේගේ ඉඩම සහ පාර ද දකුණට : එච්. අයි. මධුරාවතී සහ ඊ. එම්. බිසෝමැණිකේගේ ඉඩම ද බටහිරට : ඒ. එච්. ප්‍රේමසිරිගේ ඉඩම ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකක (අක්. 0, රූඩ්. 1, පර්.0) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමග අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B142/264 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2010 ක් වූ ජනවාරි මස 21 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

02-179

### සෙලාන් බැංකුව පීඑල්සී - ගල්කිස්ස ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීමයි

**පළමු උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. එස්. බී. විජේසේකර විසින් සාදන ලද 1974.05.30 දිනැති අංක 1307 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පින්පෝරුව වත්ත සහ කරදගහවත්ත හෙවත් පින්පෝරු වත්ත නමැති ගොඩනැගිලි, සහ එහි පිහිටි වෙනත් සියළු දේ සමග ඉඩමේ ලොට් එක්ස් ලකුණු කල ගාලු පාර වරිපනම් අංක 225 සහ 225 1/1 දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස, එකී අංක 1307 දරන සැලැස්ම අනුව පර්චස් පහයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 5.5) විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 2079/206 යටතේ ලියාපදිංචි කර ඇත.

**දෙවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ පිහිටි බලයලත් මිනින්දෝරු පී. එල්. බී. නානායක්කාර විසින් සාදන ලද 1992.02.19 දිනැති අංක 10465 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පින්පෝරුව වත්ත නමැති එහි පිහිටි ගොඩනැගිල්ල සමග ඉඩමේ ලොට් බී 1 ලකුණු කල ගාලු පාර වරිපනම් අංක 227 ඒ දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 10465 දරන සැලැස්ම අනුව පර්චස් හයක් (අ. 0, රූ. 0, පර්. 6) විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම්. 1846/266 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපල 2010 මාර්තු මස 05 වැනි දින පෙරවරු 11.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම*.- දෙහිවල මංසන්ධියේ සිට ගාලු පාර ඔස්සේ ගල්කිස්ස දෙසට කි. මී. 1 1/4 ක් පමණ ගිය විට ඇති හෝටල් පාර මංසන්ධියට පැමිණ විට ගාලු පාරේ වම්පස අදාළ දේපල පිහිටා ඇත.

මෙම දේපල ගල්කිස්ස ව්‍යාපාර ලියාපදිංචි අංක එන් (පීවීඑස්) 8731 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන මෙසස් සුපර් ෂයින් ඉන්ටර්නැෂනල් ගාමන්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්, දෙදෙනාම ගල්කිස්ස පදිංචි කැකණදුර විදාන ගමගේ කාන්තසිරි සහ විදාන ගමගේ වසන්තා යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

යෝජනා සම්මුතිය දැන්වීම *රජයේ ගැසට් පත්‍රයේ* 2009.07.10 වැනි දින පළ වී ඇති අතර, ඩේලිමිරර් සහ ලංකාදීප පුවත්පත් වල 2009.06.24 වැනි දින පළ වී ඇත. තිනකුරල් පුවත්පතේ 2009.07.07 වන දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරී (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90 , ගාලු පාර, කොළඹ 03, දුරකථන අංක : 011-2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ්. එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක : 011-3068185, 2572940.
02-121

---

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව**

ණය අංකය : 0100007093.
ණයකරුගේ සම්පූර්ණ නම : මහමරක්කලගේ දිනේෂ් කුමාර පෙරේරා.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2009.10.02 වැනි දින අංක 1622 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2009.10.02 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංකඃ 220/5, ගම්පහ පාර, යක්කල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න විසින් 2010.02.24 වැනි දින පෙ.ව. 10.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ තිස්එක්දහස් එකසිය හැත්තෑහයයි ශත හැටක (රු. 5,31,176.60) මුදලක් වර්ෂ 2009.02.28 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හාරලක්ෂ හතළිස්හතර දහස් අටසිය හැටඅටයි ශත අසූඑකක (රු.4,44,868.81) මුදල ද, 2009.02.28 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් අසූහයදහස් තුන්සිය හතයි ශත හැත්තෑනමයක් (රු.86,307.79) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් පන්ලක්ෂ තිස්එක්දහස් එකසිය හැත්තෑහයයි ශත හැටක් (රු.5,31,176.60) ද,

(2) එකී රුපියල් හාරලක්ෂ හතළිස්හතරදහස් අටසිය හැටඅටයි ශත අසූඑකක (රු.4,44,868.81) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17.75% බැගින් වන පොළියක් 2009.03.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට,

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ උඩුගහ පත්තුවේ සිද්දමුල්ල ග්‍රාමයෙහි පිහිටි තානායම් ගොඩැල්ල මූකලාන නොහොත් ඕමන්තේ කනත්ත නමැති ඉඩමට 1990.06.28 වැනි දින ඩී. ඩබ්. අබේසිංහ මානක තැන විසින් මැන සම්පාදිත අංක 3654 පිඹුර ප්‍රකාර කබැලි අංක 1 ට මායිම්, උතුරට පිඹුර අංක 976 ප්‍රකාරව කැබලි අංක 3 ද, නැගෙනහිර පිඹුර අංක 976 ප්‍රකාරව කැබලි අංක 1 දරන අඩි 10 -11 පළල පාර දකුණට කැබලි අංක 2 ද, බටහිරට පී.ඩී. එල්. ජයසිංහට හිමි තානායම් ගොඩැල්ල මූකලාන හෙවත් ඕමන්ත කනත්ත යන මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම හතයි පනහ (අක්. 0, රූ. 0, පර්. 10.75) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද ලොට් 1 හි මාර්ග පරවශ්‍යතාවය ද සමග වේ. හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 188/332 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2010 ක් වූ ජනවාරි මස 21 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යධිකාරී.

02-203

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී- තලංගම ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පදිංචියට සුදුසු වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේපත්තුවේ දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ කලාප අංක 17, ගල්කිස්ස ඕබක්සයිඩ් පාරේ, පිහිටි අංක 22 සහ 22/1, දරන "නුගගහවත්ත" (නැමති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් විසිහතයි දශම නවයයි බිංදුව) (අ. 0, රූ.0, පර්. 27.90) ක් විශාල ඉඩම සහ ඊට අයත් සියලුම දේද වේ.

මෙම දේපළ අරුණාසලම් උදයකුමාර් ණයකරු හැටියට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙතින් ලබා ගන්නා ලද ණය මුදල වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද්දා වූ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දා වූද 2005.12.02 දින සහ අංක. 2933 දරන බැඳුම්කරය යටතේ ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම*.- කොළඹ කොටුවේ සිට ගාලුපාර දිගේ කිලෝමීටර් 10.5 ක දුරක් ගිය තැන (දෙහිවල හන්දිය පසුකොට කිලෝමීටර් 1/2 දුරක් හා කිලෝමීටර් 2/3 දුරක් ගල්කිස්ස හෝටල් පාරේ හන්දියට පැමිණීමට පාර) දකුණට හැරෙන්න (ආර්පිකෝ ප්‍රදර්ශනාගාරය ඉදිරිපිට) එබන් පැත්තට (27-28 පළලට තාර දමා ඇති පාර) මීටර් 150 පමණ ගිය තැන (මුහුද ළඟට යාමට පෙර මීටර් 200) අදාළ දේපළ දකුණු පැත්තේ පිහිටා ඇත. මෙම දේපොළ අංක 22 සහ 22/1, එබර්න් සයිඩ්, දෙහිවල වේ.

හැටන් බැන්ක් පී.එල්.සී. වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2010 ක් වූ පෙබරවරි මස 23 දින පෙ.ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දි මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*යෝජනා සම්මුතිය*.- *රජයේ ගැසට් පත්‍රයේ* 2009.12.18 වැනි දිනද, දිවයින, අයිලන්ඩ් පත්‍රයේ 2009.12.14 වැනි දිනද, 2009.12.17 වැනි දින තිනකරන් පුවත්පතේද පල කරන ලද වෙන්දේසි දැන්වීමට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය*.-විකිණීම ස්ථිර කල වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක් ද, 2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1% ක් ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% ක් ද, 4. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500 සහ සියලුම ප්‍රචාරය වියදම් ද, 5. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000 ක් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් (සියයට අනූවක්), විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකාර මහතා, (අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී. බී. ජායාමාවත, කොළඹ 10, දුරකථන අංක : 011-2661835, 011-2661826.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
මුළු දිවයිනටම සාමදාන විනිශ්චයකාර.

කාර්යාලය : අංක 25 බී, බෙල්මන්ට් වීදිය, කොළඹ 12,
දුරකථනය : 011-5756356, 011-8760986.
02-206

---

**හැටන් නැෂල් බැන්ක් පීඑල්සී - වැල්ලවත්ත ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පදිංචියට සුදුසු වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටිකෝරලේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව තුළ ගංගොඩවිල ගමේ පිහිටි රබර්වත්ත පාරේ 2 වැනි පටුමගේ, වරිපනම් අංක 3 1/2 සී හි 'මිල්ලගහලක්ද' නමැති ඉඩමෙන්, ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම හතයි පහ (අ. 0, රූඩ් 0, පර්. 10.75) ක් විශාලත්වය ඇති ඉඩම සහ ඊට අයත් සියලුම දේද වේ.

මෙම දේපළ පුෂ්පකුමාර මුණසිංහ සහ මනතුංග කංකානම්ගේ ප්‍රියන්ත චන්ද්‍රකුමාර ණයකරුවන් හැටියට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙතින් ලබා ගන්නා ලද ණය මුදල වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. ද සිල්වා මහතා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූද 2007.03.14 වනි දින සහ අංක 2094 දරන බැඳුම්කරය යටතේ ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපොළට පිවිසීම*.- ගම්සභා හන්දිය පසුකොට දෙල්කද හන්දිය දක්වා කිලෝමීටර් 1.7 ක් නුගේගොඩ හන්දියේ සිට හයිලෙවල් පාර දිගේ මහරගම දෙසට යන්න. රත්තනපිටිය පාර (පරණ කැස්බෑව පාර ලෙසත් හැඳින්වේ) දෙසට දකුණු පැත්තට හැරෙන්න. එම පාර දිගේ කිලෝමීටරයක් පමණ යන්න. වම් පැත්තට රබර් වත්ත පාරට හැරෙන්න. මීටර් 250 පමණ යන්න. වම්පැත්තේ රබර් වත්ත දෙවැනි පටුමගට හැරෙන්න. හැරී මීටර් 150 ක් පමණ දුරක් යන්න. නැවතත් වමට හැරී අඩි 20 ක් පළල පාර දිගේ මීටර් 100 ක් පමණ යන්න. අඩි 10 ක් පළල පුද්ගලික පටුමගට පැමිණෙන්න. මෙම දේපළ පිහිටා ඇත්තේ මෙම පටුමගේ දකුණු අත පැත්තේය. මිනින්දෝරු සැලැස්මේ මෙය පෙන්නුම්කොට ඇත.

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2010 ක් වූ පෙබරවාරි මස 25 වැනි දින පෙ.ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*යෝජනා සම්මුතිය*.- 2009.12.11 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේද*, 2009.12.18 වන දින දිවයින, අයිලන්ඩ්, පුවත්පත් වලද 2009.12.15 වැනි දින තිනකරන් පුවත් පතේ ද, පළ කර ඇති වෙන්දේසි දැන්වීම් වලට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය*.- විකිණීම ස්ථිර කල වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක් ද, 2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1% ක් ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2 1/2% ක් ද, 4. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500 ක් ද, සියලුම ප්‍රචාරක වියදම් ද, නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000 ක් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත. හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර සඳහා විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යධිකාරී මහතා (අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10.
දුරකථන අංක : 011-2661821, 011-2661815.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු,
මුළු දිවයිනටම සාමදාන විනිශ්චයකාරිනී.

කාර්යාලය : අංක 25 'බී' බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 011-5756356, 071-8760986.
02-208

---

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - මෝදර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පදිංචියට සුදුසු වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාව් වසම් අංක 1 දරන මට්ටක්කුලිය පිහිටි කාක්ක දූපත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් දෙකයි දශම දෙකයි අටක් (අ. 0, රූ. 0, පර්. 2.28) විශාල ඉඩම සහ ඊට අයත් සියලුම දේද වේ.

මෙම දේපළ එදිරිසූරිය මද්දුමගේ සැම්සන් මහතා ණයකරු හැටියට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙතින් ලබා ගන්නා ලද ණය මුදල වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එම්. වික්‍රම විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දා වූද 2007.09.20 වැනි දින සහ අංක 514 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම*.-කොළඹ කොටුවේ සිට මට්ටක්කුලියේ පර්ගියුසන් පාරේ ගමන් කල විට හැටන් නැෂනල් බැංකුවේ මුතුවැල්ල ශාඛාව හමුවේ. එතැනින් විස්ට් වයික් පාර හමුවේ. විස්ට් වයික් උද්‍යාන පාර අවසානය තෙක් පැමිණ වම් පැත්තට හැරෙන්න. එම පාරේ ගමන් කරන විට (මුහුදු වෙරලින් මෙය අවසන්වේ) කිලෝමීටර් 150 ක් පමණ ගිය විට වම් පැත්තේ ඇති ළමා ක්‍රීඩා පිටිය සහ දකුණු පැත්තේ ඇති නාරා ආයතනයද පසුකොට මීටර් කීපයක් ඉදිරියට යන්න. වම්පැත්තේ ඇති පාරට හැරී අංක 65/89 ස්ථානයේ පිහිටි දොස්තර එස්. තිල්ලිවාසම් ගේ ඩිස්පැන්සරිය ඉදිරිපිට පාරේ ඇති පළමුවැනි නිවස අදාළ දේපළ වේ.

හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2010 ක් වූ පෙබරවාරි මස 24 වැනි දින පෙ.ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*යෝජනා සම්මුතිය*.-2009.12.11 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේද*, 2009.12.17 වන දින දිවයින සහ අයිලන්ඩ් පත්‍රයේද, 2009.12.14 වැනි දින තිනකරන් පුවත්පතේ පල වී ඇති දැන්වීම් වලට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය*.- විකිණීම ස්ථිර කල වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක් ද, 2. ප්‍රාදේශීය සභාවට 1% ක්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% ක් ද, 4. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500 ක් ද සියලුම ප්‍රචාරක වියදම් ද, 5. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000 ක් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්), විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත ගෙවා නිම කල යුතු වේ. එකී 90% ක ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකාර මහතා, (අය කිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10, දුරකථන අංක : 011-2661835, 011-2661826.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු,
මුළු දිවයිනටම සාමදානවිනිශ්චයකාර.

කාර්යාලය : 25 බී, බෙල්මන්ට් වීදිය, කොළඹ 12.
දුරකථන අංක : 011-5756356, 071-8760986.
02-207

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - පිළියන්දල ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)
1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. පී. ඒ. එන්. පියරත්න විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද අංක 67 සහ 2007.10.31 වැනි දින දරන ණය බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කෙවින් හිල්ටන් හාරිප් සහ වීරසූරිය ආරච්චිගේ තේජා තුෂාරි පෙරේරා යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ වර්ෂ 2010 ක් වූ පෙබරවාරි මස 26 වැනි දින ප.ව. 2.30 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරලේ, කුඹුකේ පත්තුවේ, හොරණ ප්‍රාදේශීය බල සීමාව තුළ වැල්මිල්ල ගමෙහි, පිහිටි දෙල්ගහවත්ත නමැති ලොට් 9 දරන ඉඩම් කොටසට බලයලත් මිනින්දෝරු ඒ. හෙට්ටිගේ විසින් 2000.02.03 වැනි දින මැන සාදන ලද අංක 2761 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති විශාලත්වය අ. 0, රූ . 0. පර්. 12.

වැඩි විස්තර සඳහා.-2009.09.03 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2009.09.02 වැනි දින ද අයිලන්ඩ්, දිවයින හා තිනකරන් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම*.- කැස්බෑව සිට බණ්ඩාරගම ප්‍රධාන මාර්ගයේ කි. මී. 07 ක් පමණ ඉදිරියට ගමන් කරන විට හමුවන වැල්මිල්ල හන්දියෙන් වමට ඇති වීදියගොඩ පාරේ තවත් කි. මී. 1.5 ක් පමණ ඉදිරියට යන විට දකුණු පසින් හමුවන මෛත්‍රී මාවතෙන් තවත් මීටර් 300 ක් පමණ ඉදිරියට පැමිනෙන විට වම් පසින් හමුවන 2 වැනි පටුමගේ තවත් මීටර් 300 ක් පමණ ඉදිරියට පැමිණෙන විට ලොට් අංක 09 සඳහා වෙන්කල මාර්ගයේ තවත් මීටර් 200 ක් පමණ ඉදිරියෙන් දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් සිදු කල යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. වෙන්දේසිය තීන්දු වූ විගස ගැණුම් මිලෙන් 10% ක මුදලක්ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක බදු මුදලද,
3. ගැණුම් මිලෙන් 2 1/2% ක් වූ වෙන්දේසිකරුගේ කොමිස් මුදලද,
4. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000,
5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,000,
6. ප්‍රචාරක වියදම්ද.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූවක් (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන එම දේපල නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු අදාල ලේඛන පරීක්ෂාකර බැලීමට හා වැඩි විස්තර දැන ගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාර (ණය අයකරීම්) හැටන් නැෂනල් බැංකුව පීඑල්සී අංක 479, ටී. බී. ජායා මාවත,ෙ කොළඹ 10.
දුරකථන අංක : 011-2664664

ශ්‍රියානි මනම්පේරි,
ප්‍රසිද්ධ වෙන්දේසිකරු, උසාවියේ කොමසාරිස්,
තක්සේරුකරු සහ බ්‍රෝකර්.

අංක 9, බෙල්මන්ට් විදිය,
කොළඹ 12.
දුරකථන අංක : 011-2320074 හෝ 0713-151356.
02-199

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - අළුත්කඩේ ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලබන)
1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

(කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද අංක 1969 සහ 2003.07.03 දින දරන ණය බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම "සින්සියර් ටෙක්නික්" යන නාමය, විලාශය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන කොඩිතුවක්කුගේ දමිත් අරුණ ජයසේන සහ ප්‍රදීපා ශ්‍රියන්ත වර්ණකුලසූරිය යන අයවලුන් ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල වර්ෂ 2010 ක් වූ පෙබරවාරි මස 25 වැනි දින පෙ. ව. 11.30 ට ඇරඹෙන පරිදි දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, අඹතලෙන් පහල, කොටිකාවත්ත -මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාවේ, කොහිලවත්ත 1 වන පටුමග තුළ කොහිලවත්ත පිහිටි වරිපනම් අංක 9/29 දරන "වැලිඕවිට" හෙවත් ජම්බුගහඕවිට, බෙලිගහවත්ත සහ මුරුතැන්ගහවත්ත නමැති ලොට් අංක 24 දරන ඉඩම් කොටසට බලයලත් මිනින්දෝරු ඩී. ජේ. ද සිල්වා විසින් 1984.04.02 වැනි දින මැන සාදන ලද අංක 1751 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති විශාලත්වය අ. 0, රූ. 0, පර්. 14.

වැඩි විස්තර සඳහා 2009.11.20 වැනි දින රජයේ ගැසට් පත්‍රය හා 2009.11.19 වැනි දින තිනකරන්, ද අයිලන්ඩ්, හා දිවයින පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම*.- කොළඹ සිට කඩුවෙල ප්‍රධාන මාර්ගයේ ඉදිරියට යන විට (ලෝලෙවල්) කොටිකාවත්ත හන්දියෙන් වම් දෙසට ඇති කොහිලවත්ත මාර්ගයේ 1 1/2කි. මි. ඉදිරියට ගිය පසු හමුවන වීරමල් මාවත හන්දියෙන් වමට ඇති වීරමල් මාවතේ මීටර් 300 ක් පමණ ගිය පසු මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.-වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් සිදුකළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. වෙන්දේසිය තීන්දු වූ විගස ගැණුම් මිලෙන් 10% ක මුදලක්ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක බදු මුදල ද,
3. ගැණුම් මිලෙන් 2 1/2% ක් වූ වෙන්දේසිකරුගේ කොමිස් මුදලද,
4. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000,
5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,000,
6. ප්‍රචාරක වියදම්ද.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූවක් (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට හා එම දේපල නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු අදාල ලේඛන පරීක්ෂා කර බැලීමට හා වැඩි විස්තර දැන ගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාර (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැංකුව පීඑල්සී අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10.
දුරකථන අංක : 011-2664664.

ශ්‍රියාණි මනම්පේරි,
ප්‍රසිද්ධ වෙන්දේසිකරු, උසාවියේ කොමසාරිස්,
තක්සේරුකරු සහ බ්‍රෝකර්.

දුරකථන අංක : 011-2320074 හෝ 0713-151356.
02-198

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

**සීමාසහිත සිල්වන් ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම විසින් උකස් කරන ලද දේපළ**

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.12.24 දිනැති අංක 1634 දරන *ගැසට් පත්‍රයේ* හා 2009.12.11 දිනැති ඩේලිනිවුස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පල කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස මෙහි පහත

උපලේඛනයේ විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම 2010.02.20 වැනි දින පෙ.ව. 11.00 ට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3හි සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි, ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් වෙන්දේසිකාර මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, රාගම්පත්තුවේ, ගම්පහ නගර සභා සීමාව තුළ, ගම්පහ මැදගම පිහිටි කෙළින් වීදියේ, වරිපනම් අංක 25 දරන මරදගහදෙණිය නමැති ඉඩමෙහි බලයලත් මිනින්දෝරු කේ. ජී. හියුබට් පෙරේරා විසින් සාදන ලද 1995 ඔක්තෝබර් 02 දිනැති අංක 5796 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා නිර්ණය කර නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : කෙළින් වීදියේ වරිපනම් අංක 29 දරන, එච්. ආර්. ෂෙල්ටන් හා වෙනත් අයට ඉඩම සහ ලොට් 1ද, නැගෙනහිරට : ලොට් 1 සහ කෙළින් වීදියද, දකුණට : ලොට් 3 ද, බස්නාහිරට : ප්‍රසිද්ධ බස්නැවතුම්පලද මායිම්ව පර්චස් අටයි දශම පහයි බිංදුවක (අ. 0, රූ.0, පර්. 8.50) බිම් ප්‍රමාණයකින් සමන්විතය.

එකී බිම් කැබැල්ල පහත සඳහන් බිම් කැබැල්ලෙන් බෙදූ හා සීමා නිර්ණය කරන ලද්දකි. එනම්,

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, රාගම්පත්තුවේ, ගම්පහ නගර සභා සීමාව තුළ, මැදගම, කෙළින් වීදියේ වරිපනම් අංක. 23, 25 සහ 27 දරන මරදගහදෙණිය නමැති ඉඩමෙහි බලයලත් මිනින්දෝරු කේ. ජී. එච්. පෙරේරා විසින් සාදන ලද 1985 ජූලි 06 දිනැති අංක. 3272 දරන පිඹුරෙහි සීමා නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම උතුරට : එච්. ආර්. ෂෙල්ටන් සහ වෙනත් අයට උරුමකම් කියන කෙළින්වීදියේ, අංක 29 දරන දේපලද, නැගෙනහිරටඃ කෙළින් වීදියද, දකුණට : සී. බාලසූරිය උරුමකම් කියන කෙළින් වීදියේ, වරිපනම් අංක 17 දරන දේපලද, බස්නාහිරට : ප්‍රසිද්ධ බස්නැවතුම්පලද මායිම්ව, පර්චස් විසිදෙකයි දශම දෙකයි පහක (අ. 0, රූ. 0, පර්. 22.25) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G19/46 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ඩී. සිල්වා,
සම්බන්ධතා කළමනාකරු,
(අයකරගැනීම් - ආයතනික).

ලංකා බැංකුව,
අයකරගැනීමේ ඒකකය,
අංක 4, ලංකා බැංකු මාවත,
කොළඹ 01.
02-171

---

**හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී - හෙට්ටිවීදිය ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. රාජනාදන් විසින් හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද 2005.07.07 දින සහ අංක 1588 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. පී. ඒ. එන්. පියරත්න විසින් හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී වෙත ලියා සහතික කරන ලද සහ 2007.08.31 දින අංක 24 කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ඩී. ඒ. කේ. අධිකාරී විසින් හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද 2008.10.29 දින අංක 364 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, සන්දනම් ජුලියස් ජෙබකුමාර් යන අය බන්ධනදායී ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු මුදල් ප්‍රමාණයන් ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා, ඉහත කී හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇති දේපළ වර්ෂ 2010 ක් වූ මාර්තු මස 01 වැනි දින පෙ.ව. 11.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**පළමුවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දකුණු අළුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ හැදල උප කාර්යාලය තුළ වසම් අංක 5 හි පිහිටි ද අල්විස් ටවුන් කලින් ගොරකගහතුඩුවේවත්ත නමැති ඉඩමට බලයලත් මානක කේ. සෙල්වරත්නම් විසින් මැන සකස් කරන ලද 2005.04.16 දින දරන අංක 106552 පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් අංක 2 දරන කොටස (ප්‍රමාණය පර්චස් විස්සක් අ. 0, රූ. 0, පර්. 20)

**දෙවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දකුණු අළුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ වත්තල ප්‍රාදේශීය සභාව සීමාව තුළ හැදල උප කාර්යාලය තුළ වසම් අංක 5 හි පිහිටි ද අල්විස් ටවුන් හි වරිපනම් අංක 105/4 අයත් අල්විස් ටවුන් කලින් ගොරකගහතුඩුවේවත්ත නමැති ඉඩමට බලයලත් මානක එස්. රාසප්පා විසින් මැන සකස් කරන ලද 2006.08.31 දින දරන අංක 454/2006 පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් අංක 2 ඒ දරන කොටස ප්‍රමාණය පර්චස් දහයයි දශම තුනයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 10.30)

*පිවිසීම*.-වත්තල අල්විස් ටවුන් පාරේ කි. මී. 1.5 ක් පමණ ගමන් කොට දකුණට හැරී 5 වන පටුමගේ ගමන් කිරීමේදී එම පාරේ වම් පසට වන්නට වරිපනම් අංක 105/4 වශයෙන් මෙම දේපල පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.07.31 වැනි දින රජයේ ගැසට් පත්‍රයේද 2009.10.21 වැනි දින අයිලන්ඩ්, දිවයින, තිනකරන් පත්‍රවල පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් භාර ගනු නොලැබේ.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1% (සියයට එකයි),
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැනුම් මිලෙන් 2.5%),
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් (සියයට අනූවක්), විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපල නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත. අදාල ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 01 දුරකථන අංක 2661826.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99 උසාවිය පාර,
කොළඹ 12,
දුරකථන අංකය : 071-4175944
02-192

---

**සෙලාන් බැංකුව පීඑල්සී - කිරිබත්ගොඩ ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

මෙම දේපල කැලණිය ව්‍යාපාර ලියාපදිංචි අංක ඩබ්ලිව් එස් 7186 දරන මෙසස් එස්. එම්. මෝටර්ස් යන නාමය, විලාසය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන සූරියආරච්චි මුදලිගේ සමන්තා සහ සුරවීර මුහන්දිරම්ගේ දොන් නිහාල් සුරවීර යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ කැලණිය ප්‍රාදේශීය සභා සීමාව තුළ පෙතියාගොඩ සහ පිලපිටිය පිහිටි බලයලත් මිනින්දෝරු එච්. එම්. ඩොනල්ඩ් විසින් සාදන ලද 1997.05.01 වැනි දිනැති අංක 841 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන අට්ටික්කාගහවත්ත, කෝන්ගහවත්ත සහ වන්නියවත්ත නැමැති ඉඩමේ ලොට් 02 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 841 දරන සැලැස්ම අනුව අක්කර දෙකයි පර්චස් දහයයි දශම හතරයි පහක් (අ. 2, රූ, 0, පර්. 10.45) විශාල එහි පිහිටි සියළුම දේ සමග ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව සී 527/215 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපළ 2010.02.26 වැනි දින පෙ. ව. 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම*.- පෑලියගොඩ සිට බියගම පාරේ කි. මී. 2 ක් පමණ ඉදිරියට ගොස් පෙතියාගොඩ උප තැපැල් කාර්යාලය පසු කර මීටර් කීපයක් ගිය විට දකුණු පසට ඇති මැවැල්ල පාරට හැරී තවත් මීටර් 200 ක් පමණ ගිය විට දකුණු පසට ඇති සුරවීර මාවතට හැරී මීටර් 200 ක් පමණ ගිය විට අදාල දේපල එම මාර්ගය අවසානයේ පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම *රජයේ ගැසට් පත්‍රයේ* 2009.07.10 වැනි දින පළවී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2009.06.22 වැනි දින ද වීරකේසරී පුවත්පතේ 2009.07.09 වැනි දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : සහකාර සාමාන්‍යාධිකාරී (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03, දුරකථන අංක : 011-2456285, 2456283, 2456284

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක : 011-3068185, 011-2572940.
01-120

---

**හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී - අම්බලන්ගොඩ ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

අම්බලන්ගොඩ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඕ. ඒ. ද සිල්වා විසින් හැටන් නැෂනල් බෑන්ක් පිඑල්සී නමට ලියා සහතික කරන ලද 2006.12.15 දින සහ අංක 1638 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මල්ලියවඩු දනේෂ් ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු මුදල් ප්‍රමාණයන් ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා ඉහත කී හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇති දේපළ වර්ෂ 2010 ක් වූ මාර්තු මස 03 වැනි දින ප.ව. 1.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ අම්බලන්ගොඩ කළුවාදුමුල්ලහි පිහිටි කනතතේවත්ත නමැති ඉඩමට බලයලත් මානක එඩ්මන්ඩ් ගාල්ලගේ විසින් මැන සකස් කරන ලද 1981.10.23 දින අංක 1130 දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් 7 එෆ් දරන කොටස ප්‍රමාණය පර්චස් විසි එකයි දශම පහයි තුනයි එකයි දෙක (අ. 0, රූ.0, පර්. 21.5312)

*ඉඩමට පිවිසීම*.- අම්බලන්ගොඩ නගරයේ ධර්මාශෝක විද්‍යාලය දෙසට පැමිණ එය පසු කර වම් පසට හැරී සංඝරාජ මාවතේ මීටර් 400 ක් පමණ වමට හැරී ශ්‍රී විජයරාම මාවතේ මීටර් 300 ක් පමණ වමට හැරී ක්‍රීඩා පිටිය පසුකර දකුණට හැරී කොන්ක්‍රීට් පාරේ මීටර් 50 ක් පමණ පැමිණි පසු එහි වම් පසින් අංක 34/1 බී හි මෙම දේපල පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.11.20 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* හා අයිලන්ඩ්, දිවයින - තිනකරන් පත්‍රවල ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1% (සියයට එකයි),
3. සියළුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැනුම් මිලෙන් 2.5%),
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැනුම් මිලෙන් 90% (සියයට අනූවක්), විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපල නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී, අංක 479, ටී. බී ජයා මාවත කොළඹ 10. දුරකථන අංක 2661826 යෙන් ලබා ගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර,
කොළඹ 12,
දුරකථන අංකය : 071-4175944.
02-186

---

**හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී - තංගල්ල ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අම්බලන්තොට ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. අමරසේන විසින් හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද 2007.04.09 දින සහ අංක 9171 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දිසානායක ආරච්චිගේ සුනිල් ප්‍රේමසිරි *නොහොත්* සුසිල් ප්‍රේමසිරි යන අය බන්ධනදායී ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොළිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලුම මුදල් ප්‍රමාණයන් ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩුකොට) අයකර ගැනීම සඳහා ඉහත කී හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇති දේපළ වර්ෂ 2010 ක් වූ මාර්තු මස 06 වැනි දින පෙ.ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ, උතුරු ගිරුවා පත්තුවේ බුද්දියාගම අලුත් වැව මුලාන නොහොත් අලුත් වැව ඇත්මග වත්ත නමින් හඳුන්වන ඉඩමට බලයලත් මානක සී. කුමාරගේ විසින් ලියා සහතික කරන ලද 1987.10.23 වන දින සහ පිඹුරු අංක 870902 හි ලොට් අංක 03 දරන කොටස. ප්‍රමාණය : පර්චස් විසි හතයි දශම තුනයි හයයි (අ. 0, රූ. 0, පර්. 27.36).

*පිවිසීම*.- වීරකැටිය හන්දියේ සිට තංගල්ල පාරේ මීටර් 500 පමණ ගමන් කිරීමේ දී දකුණු පසට වන්නට මෙම දේපළ පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.10.23 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2009.10.23 වැනි දින අයිලන්ඩ්, දිවයින, තිනකරන් පත්‍රවල පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ :

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1% (සියයට එකයි),
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැනුම් මිලෙන් 2.5%),
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැනුම් මිලෙන් 90% ක් (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත දී හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10 - දුරකථන අංක 2661826 යෙන් ලබා ගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර,
කොළඹ 12,
දුරකථන අංකය : 071-4175944.
02-190

---

**හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී - තංගල්ල ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

තංගල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. පී. එස්. ආර්. ගුණසේකර විසින් හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද 2006.08.01, 2007.03.22 සහ 2007.10.31 දිනයන් සහ පිළිවෙලින් අංක 10868, 11248 සහ 11567 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම උෂාන් ඉන්දික කෝමල ලියනාරච්චි සහ වින්සන්ට් කෝමල ලියනාරච්චි යන අයවළුන් බන්ධනදායී ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොළිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා ඉහත කී හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇති දේපළ වර්ෂ 2010 ක් වූ මාර්තු මස 05 වැනි දින පෙ.ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ දකුණු ගිරුවා පත්තුවේ කදුරුපොකුණ ගමේ පල්ලික්කුඩාව හි පිහිටි "පල්ලික්කුඩාව ලැබීම" නමින් හඳුන්වන ඉඩමට බලයලත් මානක කේ. රංජනී මාබරාන විසින් මැන සකස් කරන ලද 1999.03.19 දින සහ අංක 145 දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් අංක 01 දරන කොටස. ප්‍රමාණය : අක්කර දෙකයි, රූඩ් එකයි, පර්චස් විස්සයි (අ. 2, රූ. 1, පර්. 20)

*පිවිසීම*.- තංගල්ල නගරයේ සිට මාතර පාරේ කිලෝමීටර් 1 ක් පමණ ගමන් කොට එම පාරේ දකුණට ඇති කදුරුපොකුණ පාරේ මීටර් 800 පමණ ගමන් කොට හමුවන ලැබීම හන්දියෙන් දකුණට හැරී යන තාර පාරේ මීටර් 400 ගමන් කිරීමේදී එම පාරේ වම් පසට වන්නට මෙම දේපළ පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.10.16 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේද* 2009.10.20 වැනි දින අයිලන්ඩ්, දිවයින, තිනකරන් පත්‍රවල පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේඃ

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1% (සියයට එකයි),
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැණුම් මිලෙන් 2.5%),
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැනුම් මිලෙන් 90% ක් (සියයට අනූවක්), විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකරීම්), හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. දුරකථන අංක 2661826 යෙන් ලබා ගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99 උසාවිය පාර, කොළඹ 12,
දුරකථන අංකය : 071-4175944.
02-191

---

**හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී - කිරුළපන ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. ද සිල්වා විසින් හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද 2005.01.17 දින සහ අංක 1373 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මාම්පිටිය ආරච්චිගේ ගුණසේන සහ වර්ණපුරගේ චමින්ද සුජීව චන්ද්‍රසේන යන අය බන්ධනදායී ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොළිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා, ඉහත කී හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇති දේපළ වර්ෂ 2010 ක් වූ පෙබරවාරි මස 25 වැනි දින පෙ.ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභා සීමාවේ කිරුළපන වසම් අංක 44 හි පිහිටි පූර්වාරාම මාවතේ වරිපනම් අංක 77 ට අයත් හැඩවකගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එස්. ලෝකනාතන් විසින් මැන සාදන ලද 1967.05.17 වැනි දින අංක 432 දරන පිඹුරේ ලොට් අංක 5481 ඒ 3 දරන කොටස. ප්‍රමාණය : පර්චස් නමයයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 9.25).

පිවිසීම.-කොළඹ කොටුව සිට කිරුළපන නගරය දක්වා ගමන් කොට හයිලෙවල් පාරේ සහ පූර්වාරාම පාරේ කොටුව හන්දිය දක්වා මීටර් 200 ක් පමණ ගමන් කොට (සීබල් ඇවනිව් අසල) පූර්වාරාම පාරේ තවත් මීටර් 200 පමණ ගමන් කිරීමේ දී එම පාරට යාබදව දකුණු පැත්තට වන්නට මෙම දේපළ පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.10.02 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2009.10.09 වැනි දින අයිලන්ඩ්, දිවයින, තිනකරන් පත්‍රවල පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැනුම්කරු විසින් පහත ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ :

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1% (සියයට එකයි),
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැණුම් මිලෙන් 2.5%),
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් (සියයට අනූවක්), විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වනවිට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණයඅයකිරීම්), හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10. දුරකථන අංක 2661826 යෙන් ලබාගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස්,බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර, කොළඹ 12,
දුරකථන අංකය : 071-4175944.
02-189

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - හැටන් ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හැටන් ප්‍රසිද්ධ නොතාරිස් ආර්. සී. කරුණාකරන් විසින් ලියා සහතික කරන ලද 2007.02.09 දින සහ අංක 3503 සහ හැටන් ප්‍රසිද්ධ නොතාරිස් එස්. රාමමූර්ති විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද 2008.08.26 දින සහ අංක 313 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මුතුක්‍රිෂ්ණන් සුරේන්ද්‍රන් බන්ධනදායී ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොළිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් ද, (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කළ ඇති දේපළ වර්ෂ 2010 ක් වූ මාර්තු මස 09 වැනි දින ප.ව. 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, උඩබුලත්ගම කොට්ඨාසයේ අඹගමුව කෝරළයේ හැටන් දික්ඔය නගර සභා සීමාව තුළ දික්ඔය හි පිහිටි දික්ඔය ටවුන් නමැති ඉඩම් කොටසට බලයලත් මානක ඉරන්තතිස්ස කොටඹගේ විසින් මැන සකස් කරන ලද 2004.09.18 දින සහ අංක 7911 දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් අංක 01 දරන කොටස. ප්‍රමාණය: පර්චස් දොළහයි දශම දෙකයි බිංදුව (අ. 0, රූ. 0 පර්. 12.20).

*පිවිසීම.*- හැටන් නගරයේ සිට දික්ඔය පාරේ (බී/149 මාර්ගයේ) දික්ඔය දෙසට සැතපුම් 2 පමණ එම මාර්ගයේ ගමන් කිරීමේ දී හමුවන පන්සල පසුකොට මීටර් 30 ගමන් කිරීමේ දී වම් පසට වන්නට මෙම දේපළ පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.11.13 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ*ද 2009.11.16 වැනි දින අයිලන්ඩ් දිවයින, තිනකරන් පත්‍රවල පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1% (සියයට එකයි),
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැණුම් මිලෙන් 2.5%),
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් 90% ක් (සියයට අනූවක්), විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. දුරකථන අංක 2661826 යෙන් ලබා ගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර, කොළඹ 12,
දුරකථන අංකය: 071-4175944.
02-188

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - තංගල්ල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අම්බලන්තොට ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. අමරසේන විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද 2005.09.16 දින සහ අංක 7897 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම විදාන ගමගේ නන්දසේන සහ ගොඩිප්පිලි ගමගේ සමන් කීර්ති යන අයවළුන් බන්ධනදායී ණයකරුවන් හැටියට සහ විදාන ගමගේ නන්දසේන උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොළිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන්ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇති දේපළ වර්ෂ 2010 ක් වූ මාර්තු මස 02 වැනි දින පෙ.ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ උඩගහ පත්තුවේ, කුඩමාදුව "උඩම්පිටිය වත්ත", "දිමිටියගේ කනත්ත" සහ දිමිටියගේවත්ත" නමැති ඉඩමට බලයලත් මානක කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සකස් කරන ලද 1992.01.26 දින සහ පිඹුරු අංක 065 හි ලොට් අංක 16 දරන කොටස. ප්‍රමාණය : පර්චස් දහයයි දශම නවයයි එකයි (අ. 0, රූ. 0, පර්. 10.91).

*පිවිසීම.*- කොළඹ හොරණ පාරේ (මාර්ග අංක 120) කි. මී. 21 පමණ ගමන් කිරීමේ දී 14 වැනි සැතපුම් කණුව (කැස්බෑව නගරය පසුකොට කි. මී. 1.5 ක් ගමන් කිරීමේදී පොල්ගස්ඕවිට හන්දියට කි. මී. 1.5 ක් කලින්) අසලින් වමට හැරී යන ප්‍රසිද්ධ පාරේ (කුඩාමාදුව පාරට සම්බන්ධ වන පාරේ) කි. මී. 1.1 පමණ ගමන් කිරීමේදී (කුඩාමාදුව පාරට ලංවීමට කි. මී. 3/4 කලින්) දකුණට හැරී යන බොරළු පාරේ (ජයපුරවත්ත නිවාස සංකීර්ණය පාරේ) මීටර් 75 ක් පමණ ගමන් කර වමට හැරී යන අඩි 30 ක් පළල බොරළු පාරේ මීටර් 50 ක් පමණ ගමන් කිරීමේදී අදාළ දේපළ එම පාරේ වම් පැත්තේ ජයපුරවත්ත බේකරිය ඉදිරිපිට පිහිටා ඇත. (අංක 46/16 ජයපුරවත්ත, සිද්ධමුල්ල, පිළියන්දල)

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.11.27 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2009.11.23 වැනි දින අයිලන්ඩ්, දිවයින, තිනකරන් පත්‍රවල පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ :

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1% (සියයට එකයි),
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැනුම් මිලෙන් 2 1/2%),
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් 90% ක් (සියයට අනූවක්), විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර, එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10 යන ලිපිනයෙන් හා දුරකථන අංක 2661826 යෙන් ලබා ගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර,
කොළඹ 12,
දුරකථන අංකය : 071-4175944.
02-187

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - අලුත්කඩේ ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද 2004.10.07 දින සහ අංක 2225 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වෙලප්පු නයිදෙලාගේ ලිලාන් සම්පත් බන්ධනදායී ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොළිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇති දේපළ වර්ෂ 2010 ක් වූ පෙබරවාරි මස 25 වැනි දින ප.ව. 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ කඩුවෙල ඒකකයේ මාලඹේ පිහිටි පොල්ගස්මේලන්ද නමැති ඉඩමට බලයලත් මානක ජී. එෆ්. ඩයස් විසින් මැන සකස් කරන ලද 2002.08.04 වැනි දින අංක 1552 (1562 සී) දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් සී දරන ඉඩම ප්‍රමාණය පර්චස් දහයයි දශම අටයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 10.80).

*පිවිසීම.*- කොළඹ නව නුවර පාරේ (කොළඹ කඩුවෙල) පිට්ටුගල හන්දිය දක්වා ගමන් කොට දකුණට හැරී කහන්තොට අරංගල පාරේ කිලෝ මීටර් 1 ක් පමණ ගමන් කොට වමට ඇති අඩි 12 පළල පාරේ මෙම දේපළ පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.10.30 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2009.11.04 වැනි දින අයිලන්ඩ්, දිවයින, තිනකරන් පත්‍රවල පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ :

01. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
02. ප්‍රාදේශීය සභා බදු සඳහා 1% (සියයට එකයි),
03. සියලුම ප්‍රචාරක වියදම්,
04. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැණුම් මිලෙන් 2.5%),
05. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු.
06. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් 90% ක් (සියයට අනූවක්), විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී ජයා මාවත, කොළඹ 10 යන ලිපිනයෙන් හා දුරකථන අංක 2661826 යෙන් ලබා ගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර,
කොළඹ 12,
දුරකථන අංකය : 071-4175944.
02-185

---

LE/RE/208.

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2400000454.

ණයකරුගේ සම්පූර්ණ නම: හෙට්ටි ආරච්චිලාගේ දයා හර්ෂප්‍රිය ගුණරත්න.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2008.01.18 වැනි දින අංක 1533 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2008.02.15 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 220/5, ගම්පහ පාර, යක්කල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න මයා විසින් 2010.02.25 වැනි දින පෙ. ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ පනස්දහස් හැත්තෑවයි ශත විසිහතක (රු.2,50,070.27) මුදලක් වර්ෂ 2007.05.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ අනූහයදහස් හත්සිය හැටයි ශත තිස්දෙකක (රු.1,96,760.32) මුදල ද, 2007.05.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් පනස්තුන්දහස් තුන්සිය නමයයි ශත අනූපහක් (රු. 53,309.95) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ පනස්දහස් හැත්තෑවයි ශත විසිහතක් (රු. 2,50,070.27) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ අනූහයදහස් හත්සිය හැටයි ශත තිස්දෙකක (රු.1,96,760.32) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.50.% බැගින් වන පොළියක් 2007.06.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

#### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, දකුණු උඩපත්තුවේ කුරුවිට කෝරළයේ රත්නපුර මහ නගර සභා සීමාවේ රත්නපුර නගරයේ වරිපනම් අංක 15 මුස්ලිම් පල්ලිය පාරේ පිහිටි ඇලමුල්ලේවත්තේ කොටසක් නමැති ඉඩමට 1986.11.25 දින එම්. සමරසේකර මානක තැන විසින් මැන සම්පාදිත අංක 1036 පිඹුර ප්‍රකාර ලොට් 5 ට මායිම්, උතුරට : ඇළ ද, ඊසානට සහ නැගෙනහිරට : ලොට් 4 (පාර) සහ ලොට් 3 ද, බටහිරට සහ නිරිතට ඇළ ද, යන මායිම් තුළ පිහිටි පර්චස් විසිහතරයි දශම පහක් (අක්. 0, රූඩ් 0, පර්. 24.5) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතාවය ද සමග රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 450/272 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2010ක් වූ ජනවාරි මස 21 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

02-183

---

LE/RE/208.

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0234400434.

ණයකරුගේ සම්පූර්ණ නම: සුමිත් සමන් ශ්‍රේෂන් ද සිල්වා

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2009.08.14 වැනි දින අංක 1615 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2009.08.14 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 220/5, ගම්පහ පාර, යක්කල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න මහතා විසින් 2010.02.22 වැනි දින පෙ. ව. 10.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ දෙළොස්දහස් නමසිය දෙකයි ශත පනස්අටක (රු. 3,12,902.58) මුදලක් වර්ෂ 2009.01.31 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ පනස්දෙදහස් දෙසිය දාසයයි ශත හැත්තෑදෙකක (රු. 2,52,216,72) මුදල ද, 2009.01.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් හැටදහස් හයසිය අසූපහයි ශත අසූහයක් (රු. 60,685.86) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තුන්ලක්ෂ දෙළොස්දහස් නමසිය දෙකයි ශත පනස්අටක් (රු. 3,12,902,58) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ පනස්දෙදහස් දෙසිය දාසයයි ශත හැත්තෑදෙකක (රු. 2,52,216.72) මුදල මත අයවිය යුතු වර්ෂයකට 14.50.% බැගින් වන පොළියක් 2009.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ රාගම් පත්තුවේ වත්තල ප්‍රාදේශීය සභා සීමාවේ පමුණුගම උප කාර්යාලයේ නුගපේ ග්‍රාමයේ හි පිහිටි කැබැල්ලගහඕවිට, කුඹුක්ගහඕවිට සහ කුඹුක්ගහවත්ත නමැති ඉඩමට 1998.05.04 දින ඩබ්. එස්. එස්. පෙරේරා මානක තැන විසින් මැන සම්පාදිත අංක 3778 පිඹුර ප්‍රකාර ලොට් 27 ට මායිම්, උතුරට : ලොට් 13 (අඩි 20 පළල පාරක් සඳහා වෙන් කරන ලද) නැගෙනහිරට : ලොට් 26 ද, දකුණට : ලොට් 28 ද, බටහිරට : පාර (අධිවේගී) යන මායිම් තුළ පිහිටි පර්චස් එකොළහයි දශම පහයි බිංදුවක් (අක්. 0 රූ. 0, පර්. 11.50) වපසරියකින් යුතු මෙම ඉඩම ගොඩනැගිලි හා ඊට අයත් සියලු දේ ද මාර්ගපරවශතාවය සමග ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 461/215 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2010ක් වූ ජනවාරි මස 21 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය,

සාමාන්‍යාධිකාරී.

02-178

---

### හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - ඇල්පිටිය ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඇල්පිටිය ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. මහගොඩගේ විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ ද 2007.02.12 දින හා අංක 5437 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලයනල් බාලසූරිය යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරු ගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී,

2010ක් වූ පෙබරවාරි මස 26 වැනි දින පෙ. ව. 10.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.*-දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ දකුණු ගඟබොඩ පත්තුවේ, අම්පෙගම පිහිටි අටකලං එස්ටේට් නමැති ඉඩමට බලයලත් මානක එම්. ජී. ලයනල් විසින් මැන සාදන ලද අංක 453 සහ 2005.01.06 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් සී ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වේ.

විශාලත්වය : අක්කර 6, රූඩ් 2, පර්. 28.3.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2009.12.18 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2009.12.21 වැනි දින අයිලන්ඩ් සහ දිවයින පුවත්පත් ද 2009.12.15 දින තිනකරන් පුවත්පත ද බලන්න.

*ඉඩමට පිවිසීම.*-ගාල්ල බස් නැවතුම්පලේ සිට කොළඹ පාරේ සැතපුම් 6ක් පමණ ගොස් හමුවන කුමාරකන්දෙන් දකුණට හැරී ඇල්පිටිය පාරේ සැතපුම් 4කුත් යාර කීපයක් ගියවිට ඇති අම්පෙගම හන්දියෙන් දකුණට හැරී තාර දමා ඇති ප්‍රධාන මාර්ගයෙන් ද මෙම දේපළට පිවිසිය හැක. එසේම ඉඩම් වෙන්දේසියක් සඳහා වූ රක්ෂිතයෙන් ද ගොස් අම්පෙගම නන්දසාර කණිෂ්ඨ විද්‍යාලයට යාබදව අදාළ දේපළට යා හැකි ය.

මෙම ඉඩමට ප්‍රධාන මාර්ගයෙන් මෝටර් රථයකින් ලංවීමේ හැකියාව ඇත.

*ගෙවීමේ ක්‍රමය.*-වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, (දුරකථන අංක : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලය ලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777 378441,
0714 424478,
ෆැක්ස් අංකය : 0114-617059.
02-166

---

### සෙලාන් බැංකුව පීඑල්සී - නුගේගොඩ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ පිටකෝට්ටේ පදිංචි ඉලංගසිංහ කිරිබණ්ඩාගේ සුද්දහාමිගේ නිශාන්ති ඉලංගසිංහ සහ කෝරාළලාගේ රොෂාන් අනුර කුමාර බණ්ඩාර යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ පිටකෝට්ටේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ඩී. සී. හීන්දෙනිය විසින් සාදන ලද 1988.09.11 දිනැති අංක 135 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මඩතියගහවත්ත නැමති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 135 දරන සැලැස්ම අනුව පර්චස් දහතුනයි දශම දෙකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 13.20) විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩම.

එකී ලොට් 1 පහත සඳහන් ඉඩමේ නැවත මැනීමකි.

ඉහත සඳහන් දේපළ 2010 පෙබරවාරි මස 25 වැනි දින පෙරවරු 10.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.*-පිටකෝට්ටේ මංසන්ධියේ සිට කෝට්ටේ පාර ඔස්සේ ඇතුල් කෝට්ටේ දක්වා ගොස් තවත් මීටර් 850ක් පමණ ගියවිට ඇති බංගලා හංදියේ අදාළ දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.*- රජයේ ගැසට් පත්‍රයේ 2009.10.09 දින පළවී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2009.09.30 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2009.10..05 දින පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*-සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

(1) ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), (2) පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක් (3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), (4) නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 (5) ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, (6) සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම්

මිලෙන් ඉතිරි 90% ද, විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරි (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක : 011-2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු)
බලයලත් වෙන්දේසිකරු සහ
උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක : 011-3068185, 011-2572940.
02-117

---

**හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී - අම්බලන්ගොඩ ශාඛාව**

කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩේවිඩ් විසින් හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද 2007.04.24 දින සහ අංක 2888 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගෝනපීනුවල විතානගේ හර්බට් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා,

ඉහත කී හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇති දේපළ වර්ෂ 2010ක් වූ මාර්තු මස 03 වැනි දින පෙ. ව. 11.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ වෙල්ලබඩ පත්තුවේ ගොඩගම පැපිලියගහඅඩුමුල්ල කොස්ගහ වෙල්යාය නමැති ඉඩමට බලයලත් මානක පීඑච්ඩී සිල්වා විසින් මැන සකස් කරන ලද 1994.10.05 දින දරන අංක 434 දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් අංක ඒ දරන කොටස.

ප්‍රමාණය රූඩ් දෙකයි පර්චස් දොළහයි (අ. 0, රූ. 2, පර්. 12)

*පිවිසීම.*- මිටියාගොඩ සිට අළුත්වල පාරේ කොස්ගහවෙල දක්වා කි. මී. 2 1/2 පමණ මත් කිරීමේ දී එම පාරට යාබදව මෙම දේපළ පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.10.23 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ ද 2009.10.23 වැනි දින අයිලන්ඩ්, දිවයින, තිනකරන් පත්‍රවල පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*-වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රදේශීය සභා බදු සඳහා 1% (සියයට එකයි),
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැණුම් මිලෙන් 2.5%),
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් (සියයට අනුවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වනවිට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක 2661826.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

නො. 99, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංකය : 071-4175944
02-193

---

**හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී - තංගල්ල ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)
1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අම්බලන්තොට ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. අමරසේන විසින් හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද 2006.06.21 දින සහ අංක 8487 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හේවාගජමන් කංකානම්ගේ කුෂාන් ගංගන සහ හේවාගජමන් කංකානම්ගේ සුනිල් ප්‍රේමසිරි ණයකරුවන් සහ හේවාගජමන් කංකානම්ගේ කුෂාන් ගංගන උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩු කොට) අයකර ගැනීම සඳහා

ඉහත කී හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇති දේපළ වර්ෂ 2010ක් වූ මාර්තු මස 05 වැනි දින ප. ව. 1.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවා පත්තුවේ, කහවත්ත හි පිහිටි 'ඇලහේන්පිටිතැන්න ලියනාච්චිගේ වත්ත' නමැති ඉඩමට බලයලත් මානක ටී. එච්. ජීවානන්ද විසින් මැන සකස් කරන ලද 1992.05.22 දින සහ අංක 92/59 ඊ 145 දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් අංක 01 දරන කොටස

*ප්‍රමාණය.*- අක්කර එකයි පර්චස් දහය (අ. 1, රූ. 0, පර්. 10)

*පිවිසීම.*- බෙලිඅත්ත නගරයේ සිට වලස්මුල්ල පාරේ කි. මී. 1ක් පමණ කහවත්ත මහා විද්‍යාලය තෙක් ගමන් කිරීමේ දී එම පාරේ වම් පසට වන්නට මෙම දේපළ පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.10.30 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2009.11.04 වැනි දින අයිලන්ඩ්, දිවයින, තිනකරන් පත්‍රවල පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*-වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රදේශීය සභා බදු සඳහා 1% (සියයට එකයි),
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැණුම් මිලෙන් 2.5%),
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් (සියයට අනුවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වනවිට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපල නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක 2661826යෙන් ලබාගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

නො. 99, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංකය : 071-4175944
02-194

**කඩුවෙල දිසා අධිකරණයේ දී ය**
**පිස්කල් වෙන්දේසියේ විකිණීම**

මහනුවර ඩී. එස්. සේනානායක වීදියේ අංක 281හි තම ශාඛා කාර්යාලය පිහිටි සීමාසහිත ද ෆිනෑන්ස් සමාගම පී.එල්.සී.

නඩු අංකය : ඩීඑම්බී 00040/80 — පැමිණිලිකරු..........................

එදිරිව

01 අතුරුගිරිය මිලේනියම් සිටි ඔලිම්පස් අංක : 340 හි පදිංචි ප්‍රදීප් ප්‍රියමාල් ශාන්ත දුනුවිලගේ

විත්තිකරු..............................

ඉහත අංක දරන නඩු වාර්තාවේ ඇතුළත් කර ඇති වර්ෂ 2006ක් වූ ජූලි මස 02 වැනි දිනැති තීන්දු ප්‍රකාශය මගින් ඉහත විත්තිකරුගෙන් පැමිණිලිකරුට රුපියල් පනස් දෙලක්ෂ පනස් දාහක් (රු. 52,50,000) ද, වර්ෂ 2008 මැයි මස 08 වැනි දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම වන තුරු අවුරුද්දකට 04%ක් බැගින් එකතු වන පොලියත් අය කර ගැනීමට ආඥා කොට ඇති බැවින් ද,

ඉහත කී රු. 52,50,000 ක මුදල හා වැඩිදුර පොලිය ද නඩු ගාස්තු ද යන එකී මුදලින් දැනට ගෙවා ඇති රු. 2,21,480 ක මුදල අඩුකර ගැනීමෙන් පසු විත්තිකරුගෙන් අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ එකී පහත විස්තර කර ඇති දේපළට අයත් සියළු අයිතිවාසිකම් පරවශතා සහ අනුබද්ධකයින් ද විත්තිකරුගෙන් කවර ආකාරයන් හෝ සියළු අයිතිවාසිකම් හිමිකම් බලපෑම්, පුළුවන්කාරකම් සහ ඉල්ලීම් ද මෙහි පහත උපලේඛනයේ හා පැමිණිල්ලේ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළෙන් උපදන සහ එකතුවන සියළු කුලී ලාභ සහ අනෙකුත් ආදායම් සියලු ගිවිසුම් සහ රක්ෂණ ගිවිසුම් ද ඇතුළුව මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති එකී දේපල නිශ්චිතවම බැඳී ඇති බව හා ඇස්කීසි කළ හැකි බව ප්‍රකාශ කරන ලද හෙයින් ද අධිකරණයෙන් නියම කරන ලද කොන්දේසිවලට යටත්ව පහත උපලේඛනයෙහි විස්තර කර ඇති දේපළ වර්ෂ 2010ක් වූ පෙබරවාරි මස 13 වැනි දින පෙ. ව. 11.00ට ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ හෝකන්දර පිහිටි වෙල්ලන්ගිරිය එස්ටේට් නම් වන ඉඩම සම්බන්ධයෙන් වර්ෂ 2002.03.25 වැනි දින එස්. පී. රණසිංහ බලයලත් මිනින්දෝරු මහතා විසින් මැන සකස් කරන ලද අංක 1282 දරන පිඹුරේ කැබලි අංක 48 නම් වන පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) හෙක්ටයාර් 0.02529ක විශාලත්වයෙන් යුතු ඉඩම් කොටසට ඉහත පිඹුර ප්‍රකාර මායිම් උතුරට : ඉහත පිඹුරේ කැබලි අංක 49 ද නැගෙනහිරට : ඉහත පිඹුරේ කැබලි අංක 10 ද, දකුණට : ඉහත පිඹුරේ කැබලි අංක 46 ද බටහිරට : ඉහත පිඹුරේ කැබලි අංක 64 ද යන ඉහත කී අංක 1283 පිඹුරේ පාර සඳහා වෙන් කර ඇති කැබලි අංක 64, 65 සහ 71 මතින් යාම් ඊම් අයිතිය ගහකොල පළතුරු ගොඩනැගිලි ආදී සෑම සියළු දෙය ද වේ. එකී කැබලි අංක 48 හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක පී 1556/218 හි ලියාපදිංචි කර ඇත.

ඩබ්. ඒ. කේ. නිමල්,
රෙජිස්ට්‍රාර්/ නියෝජ්‍ය පිස්කල්,
දිසා මහේස්ත්‍රාත් අධිකරණය -කඩුවෙල.

2009 දෙසැම්බර් මස 04 වැනි දින දී ය.
02-30

---

**හැටන් නැෂනල් බැංකුව පීඑල්සී - ගල්කිස්ස ශාඛාව**

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව විකිණීම

**වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලයේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස නගර සීමාවේ (පැරණි) රත්මලාන, වෛද්‍ය හරස් පාර, වරිපනම් අංක 21/5 දරන කුරුඳුගහවත්ත නමැති ඉඩමේ ලොට් අංක 01 දරන කොටසට බලයලත් මිනින්දෝරු ජී. බී. දොඩන්වල මහතා විසින් 2004.09.23 දින මැන සාදන ලද අංක 5051 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති ප්‍රමාණයෙන් (අ. 0, රූ. 0, පර්. 21.50) සහ ඒ තුළ පිහිටි වැව්ලි ගොඩනැගිලි ගහකොළ ඇතුළු සියලු දේ ද වේ.

හැටන් නැෂනල් බැංකුව පීඑල්සී විසින් මා වෙත පවරන ලද බලය යටතේ වර්ෂ 2010ක් වූ පෙබරවාරි 24 වැනි දින පෙ. ව. 10.30ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

(කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා මහතා විසින් සහතික කරන ලද අංක 1161 සහ 2005.09.15 වැනි දින දරන ණය බැඳුම්කරය මත අමරසිංහගේ අජිත් පෙරේරා යන අය බැංකුවට උකස් කරන ලද දේපළ)

*වැඩිදුර විස්තර සඳහා.*-2009.08.21 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2009.08.18 වැනි දින ද අයිලන්ඩ්, දිවයින හා තිනකරන් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.*- කොළඹ-ගාල්ල ප්‍රධාන මාර්ගයේ රත්මලාන බෙලෙක් කඩේ හන්දියේ සිට තවත් මීටර් 400ක් පමණ ඉදිරියට පැමිණෙන විට වම් පසින් හමුවන රජමල්වත්ත පාරේ (වයි. එම්. බී. ඒ සහ ලංකා බැංකු ශාඛාව) තවත් මීටර් 50ක් පමණ ඉදිරියට යන විට හමුවන වෛද්‍ය හරස් පාරේ තවත් මීටර් 250ක් පමණ ඉදිරියට පැමිණෙන විට පාරේ වම් පසින් මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*-සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් අයුරින් ගෙවීම් සිදුකළ යුතුයි.

1. වෙන්දේසිය තීන්දු වූ විගස ගැණුම් මිලෙන් 10%ක මුදලක් ද,
2. ඉතිරි 90%ක මුදල වෙන්දේසි දින සිට රාජකාරි දින 30ක් ඇතුලත ද,
3. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක බදු මුදල ද,
4. ගැණුම් මිලෙන් 2 1/2% ක් වූ වෙන්දේසිකරුගේ කොමිස් මුදල ද,
5. ප්‍රචාරක වියදම් ද,
6. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව ද,
7. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව ද

හිමිකම් ඔප්පු අදාළ ලේඛන පරීක්ෂාකර බැලීමට හා වැඩි විස්තර දැන ගැනීම සඳහා කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479 දරන තැන පිහිටි හැටන් නැෂනල් බැංකුව පීඑල්සී හි ජ්‍යෙෂ්ඨ කළමනාකාර (නීති) අමතන්න.

දුරකථන අංක : 011-2661826.

ශ්‍රියාණි මනම්පේරි,
ප්‍රසිද්ධ වෙන්දේසිකරු, උසාවියේ කොමසාරිස්,
තක්සේරුකරු සහ බ්‍රෝකර්.

දුරකථන අංක : 011-2320074 හෝ 0713-151356
අංක 09, බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.
02-197

---

**සෙලාන් බැංකුව පීඑල්සී - නුගේගොඩ ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ නුගේගොඩ ව්‍යාපාර ලියාපදිංචි අංක ඩබ්ලිව් 73094 දරන මෙසස් සුනිකෝ ට්‍රේඩිං කම්පැනි යන නාමය, විලාශය සහ අභිධානය යටතේ තනි ස්වාමීත්වයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන පන්නිපිටිය පදිංචි කොඩිතුවක්කු ආරච්චිගේ සුනිල් හෙවත් සුනිල් කොඩිතුවක්කු යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*1 වැනි වෙන්දේසියේ විකිණීම*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ මාකුඹුර ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. කපුගීකියන විසින් සාදන ලද 2004.06.30 වැනි දිනැති අංක 5957 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෙල්ගහවත්ත, හෝමාගම, මායා මාවත, වරිපනම් අංක 374/4 දරන ඉඩමේ ලොට් ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 5957 දරන සැලැස්ම අනුව පර්චස් දහසයයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 16.5) විශාල ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ජී 1064/258හි ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතීන් සහ එයට අදාළ වෙනත් පොදු අයතීන් සමගය.

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ මාකුඹුර ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. කපුගීකියන විසින් සාදන ලද 1985.08.31 දිනැති අංක 2033 ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෙල්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 19 ලකුණු කළ (අඩි 20 පළල පාර සඳහා වෙන්කිරීම) බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස එකී අංක 2033ඒ දරන සැලැස්ම අනුව පර්චස් විසිතුනක් (අ. 0, රූ. 0, පර්. 23) විශාල ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ජී 1414/51 හි ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපළ 2010 පෙබරවාරි මස 25 වැනි දින පස්වරු 1.30ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.*-කොළඹ සිට හයිලෙවල් මාර්ගය ඔස්සේ රත්නපුර දෙසට කි. මී. 21ක් පමණ ගියවිට ඇති මාකුඹුරට පැමිණ වම්පසට ඇති මායා මාවතට හැරී තවත් මීටර් 200ක් පමණ ගියවිට අදාළ දේපළ පිහිටා ඇත.

*2 වැනි වෙන්දේසියේ විකිණීම*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ බොරලැස්ගමුව පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. කපුගීකියන විසින් සාදන ලද 2005.06.18 දිනැති අංක 6125 දරන සැලැස්මේ පෙන්නුම්කරනු ලබන දෙල්ගහලන්ද නමැති ඉඩමේ ලොට් ඒ ලකුණු කළ ඉඩම් කොටස එකී අංක 6125 දරන සැලැස්ම අනුව පර්චස් විසිදෙකයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 22.25) විශාල ඉඩම

පහත සඳහන් ඉඩම තුළ උඩින් හා දිගේ මාර්ග අයිතීන් සහ එයට අදාළ වෙනත් පොදු අයතීන් සමඟ

(01) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම සුළුනගර සභා සීමාව තුළ බොරලැස්ගමුව පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එම්. පෙරේරා විසින් සාදන ලද 1981.05.25 දිනැති අංක 1735 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෙල්ගහලන්ද නමැති ඉඩමේ ලොට් 55 ලකුණු කළ (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කිරීම) (බලයලත් මිනින්දෝරු කේ. එම්. සමරසිංහ විසින් සාදන ලද 1979.10.12 දිනැති අංක 2073 දරන සැලැස්මේ සඳහන් එකතු කළ ලොට් සී. ඩී. සහ කියුහි අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 1735 දරන සැලැස්ම අනුව පර්චස් හතරයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 4.5) විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව එම් 2012/297හි ලියාපදිංචි කර ඇත.

(2) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම සුළුනගර සභා සීමාව තුළ බොරලැස්ගමුව පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එම්. පෙරේරා විසින් සාදන ලද 1981.05.25 දිනැති අංක 1735 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෙල්ගහලන්ද නමැති ඉඩමේ ලොට් 52 ලකුණු කළ (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම) බලයලත් මිනින්දෝරු කේ. එම්. සමරසිංහ විසින් සාදන ලද 1979.10.12 දිනැති අංක 2073 දරන සැලැස්මේ සඳහන් එකතු කළ ලොට් සී. ඩී. සහ කියු. හි අතුරු බෙදීමක් වන) බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස එකී අංක 1735 දරන සැලැස්ම අනුව පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව එම් 2388/271හි ලියාපදිංචි කර ඇත.

(3) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම සුළුනගර සභා සීමාව තුළ බොරලැස්ගමුව පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එම්. පෙරේරා විසින් සාදන ලද 1981.05.25 දිනැති අංක 1735 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෙල්ගහලන්ද නමැති ඉඩමේ ලොට් 24 ලකුණු කළ (අඩි 30ක් පළල පාර සඳහා වෙන්කිරීම) (බලයලත් මින්න්දෝරු කේ. එම්. සමරසිංහ විසින් සාදන ලද 1979.10.12 දිනැති අංක 2073 දරන සැලැස්මේ සඳහන් එකතු කළ ලොට් සී. ඩී. සහ කියු. හි අතුරු බෙදීමක් වන) බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස එකී අංක 1735 දරන සැලැස්ම අනුව පර්චස් තිස් හතරක් (අ. 0, රූ. 0, පර්. 34) විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව එම් 2194/282හි ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් දේපළ 2010 පෙබරවාරි මස 25 වැනි දින පෙරවරු 11.30ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම* : මහරගම නගර මධ්‍යයේ සිට හයිලෙවල් මාර්ගය ඔස්සේ කොළඹ දෙසට මීටර් 250ක් පමණ ගියවිට වම් පසට ඇති ඇල්හේන පාරට හැරෙන්න. එම මාර්ගයේ තවත් මීටර් 300ක් පමණ ගියවිට වම් පසට ඇති අරලිය මාවතට හැරී මීටර් 80ක් පමණ ගියවිට නැවතත් වම් පසට ඇති අඩි 10ක් පළල වාහන ගමන් කළහැකි මාර්ගයට හැරී මීටර් 20ක් පමණ ගියවිය අදාළ දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම* : *රජයේ ගැසට් පත්‍රයේ* 2009.10.29 දින පළවී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2009.10.02 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2009.10.01 වැනි දින පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය* : සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පලාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්),
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000
5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500
6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.

සහකාර සාමාන්‍යාධිකාරි (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දු. ක. 011 2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ්. එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව
දුරකථන අංක : 0113068185, 011 2572940.
02-118

---

**හැටන් නැෂනල් බැංකුව පීඑල්සී - අවිස්සාවේල්ල ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)
1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

(කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී.ඩී. ටී. ධර්මතිලක විසින් හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද අංක 1733 සහ 2007.04.09 දින දරන ණය බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගෝවින්නගේ ගිෂානි වික්‍රමසිංහ සහ සුජීවා කොඩිතුවක්කු යන අයවලුන් ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්,

හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ වර්ෂ 2010 ක් වූ පෙබරවාරි මස 22 වැනි දින ප. ව. 2.30ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිට කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව නගර සභා සීමාවේ පෙලැන්වත්ත හි පිහිටි මහල්වරාව සිට පෙලැන්වත්ත දක්වා දිවෙන ප්‍රාදේශීය සභා පාර ඔස්සේ පිහිටි කොස්ගහවත්ත නමැති ඉඩමේ ලොට් අංක ඒ 1 දරණ ඉඩම් කොටසට බලයලත් මිනින්දෝරු කේ. වී. එම්. ඩබ්. සමරනායක විසින් 2007.01.16 වැනි දින මැන සාදන ලද අංක 2840බී දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති විශාලත්වය පර්චස් එකොළහක් (අ. 0, රූ. 0, පර්. 11).

*වැඩිදුර විස්තර සඳහා* : 2009.11.13 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2009.11.16 වැනි දින තිනකරන්, දි අයිලන්ඩ්, හා දිවයින පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම* : පෙලැන්වත්ත මහල්වරාව හන්දියෙන් ආරම්භ වන පන්නිපිටිය පාරේ මීටර් 500 පමණ කොට්ටාව දෙසට පැමිණෙන විට පෙලැන්වත්ත පාරට මායිම්ව හමුවන මහල් නිවාස යෝජනා ක්‍රමයේ මෙම දේපළ පිහිටා ඇත. මෙම දේපලේ සිට හයිලෙවල් පාරට ඇත්තේ කි. මී. 01ක් පමණ දුරකි.

*ගෙවීමේ ක්‍රමය* : වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් සිදුකළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. වෙන්දේසිය තීන්දු වු විගස ගැණුම් මිලෙන් 10% ක මුදලක්ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක බදු මුදලද,
3. ගැණුම් මිලෙන් 2 1/2% ක් වූ වෙන්දේසිකරුගේ කොමිස් මුදලද,

4. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000
5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,000
6. ප්‍රචාරක වියදම් ද,

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූවක් (90%) විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත හැටන් නැෂනල් බැංකුව පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන එම දේපල නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු අදාළ ලේඛන පරීක්ෂාකර බැලීමට හා වැඩි විස්තර දැන ගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාර (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැංකුව පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2664664.

ශ්‍රියාණි මනම්පේරි,
ප්‍රසිද්ධ වෙන්දේසිකරු, උසාවියේ කොමසාරිස්,
තක්සේරුකරු සහ බ්‍රෝකර්.

දුරකථන අංක 011-2320074 හෝ 0713-151356
අංක 09, බෙල්මන්ට් වීදිය, කොළඹ 12.
02-196

---

**ජාතික ඉතිරිකිරීමේ බැංකුව**

**සංශෝධිත පරිදි වූ 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව සතු අගනා දේපළක් වෙන්දේසියේ විකිණීම**

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ දකුණු කලාගම් කෝරලේ, කලාගම් පළාතේ වැව් තුලානේ, කැකිරාව ප්‍රාදේශීය සභා බල සීමාව තුල සෙක්කුපිටිය පාරේ පිහිටි පස්ඉස්සර නමින් හැඳින්වෙන ඉඩමෙන්, බෙදාවෙන්කළ බිම් කට්ටිය වන පර්චස් 15ක විශාලත්වය ඇති ලොට් අංක 17 දරන ඉඩම.

*දේපළ විස්තර :* උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ දකුණු කලාගම් කෝරලේ, කලාගම් පළාතේ වැව් තුලානේ, කැකිරාව ප්‍රාදේශීය සභා බල සීමා තුළ සෙක්කුපිටිය පාරේ පිහිටි පස්ඉස්සර නමින් හැඳින්වෙන ඉඩමෙන්, බලයලත් මිනින්දෝරු ඩබ්. සී. දසනායක විසින් මැන සාදන ලද 2001.05.26 දිනැති අංක 5730 දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන්කළ බිම් කට්ටිය වන පර්චස් 15ක (අක්. 0, රූඩ්. 0, පර්. 15) විශාලත්වයක් ඇති ලොට් අංක 17 දරන ඉඩමට මායිම්, උතුරට ලොට් අංක 14 ද, නැගෙනහිරට එම්. තිලකරත්න මහතාගේ ඉඩමද, දකුණට ලොට් අංක 18ද, බටහිරට ලොට් අංක 03, ලෙස දක්වා ඇති මාර්ගයද, යන මායිම් තුළ පිහිටි අක්. 0, රූ. 0, පර්. 15 හෝ හෙක්ටයාර් 0.3793 ක වපසරියකින් යුත් ඉඩම සමග ඇති ගොඩනැගිලි ගහකොළ ඇතුළු සියලු දේ අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී/164/339 යටතේ ලියාපදිංචි කර ඇත.

පිඹුරුපත් අංක 5730 හි ලොට් අංක 03 ලෙස දක්වා ඇති මාර්ග රක්ෂිතයේ මාර්ග අයිතියද සහිතවය.

මෙම දේපළ ජාතික ඉතිරිකිරීමේ බැංකුවට උකස් තබා ඇත්තේ කැකිරාව උසාවිය පාරේ පදිංචි අකුරුස්ස හේවගේ විමලසිරි මහතාය.

*දේපලට ලඟා වීම :* කැකිරාව, යක්කල පාර හන්දියෙන් මීටර් 100, දඹුල්ල පාරේ ගොස් දකුණු අතට ඇති සෙක්කුපිටිය පාරේ පරණ බස් නැවතුම්පළ ඉදිරිපිටින් මීටර් 750 ගිය තැන දේපළ පිහිටා ඇත. මෙම දේපළ පාරෙන් වම් අත පැත්තේ ඇත.

මෙම දේපළ අප විසින් 2010 පෙබරවාරි මස 19 වැනි සිකුරාදා පෙ. ව. 11.00ට දේපළ පිහිටි ස්ථානයේදී ඊට අයත් සියලු දේ සමග ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගෙවීමේ ක්‍රමය : සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය නිමවූ වහාම පහත සඳහන් මුදල් ප්‍රමාණයන් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 25%ක්,
2. ගැණුම් මිලෙන් 1%ක් ප්‍රාදේශීය සභා අයබදු ලෙස ගෙවිය යුතුය,
3. ගැණුම් මිලෙන් 2 1/2% ක් (සියයට දෙකහමාරක ප්‍රතිශතයක්) වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස ගෙවිය යුතුය,
4. සම්පූර්ණ ප්‍රචාරක ගාස්තු වියදම රු. 105,447,
5. ලිපිකරුගේ හා සෝෂකයේ ගාස්තුව රු. 500,
6. වෙන්දේසිය සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 3,000ක් ගෙවිය යුතුය.

ගැණුම් මිලෙන් ඉතිරි වූ 75%ක මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුලත බැංකුව වෙත ගෙවිය යුතුය.

වැඩිදුර විස්තර සහ විකුණුම් කොන්දේසි සඳහා සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති මූල්‍ය හා ශාඛා ණය), නිවාස ණය අංශය, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, අංක 225, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක 011-4940261.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ බැංකු සඳහා පිළිගත් පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ සහ තක්සේරුකරුවෝ.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර, මහනුවර
දුරකථන අංකය : 081-2224371, 081-2227593,
ඊ-මේල් :schokmankandy@sltnet.lk
*නාගරික කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය:*
අංක 290, හැව්ලොක් පාර, කොළඹ 05,
දුරකථන අංකය : 94(0) 112585408, 2502680
ෆැක්ස් අංකය : 94 (0) 112588176
ඊ-මේල් : schokman@samera 1892.com
02-149

---

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. (කලින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්)**

